''බලන්න මේ සමන් දෙවි හාමුදුරුවො. සමන් දෙවි හාමුදුරුවන්ගෙ අඩවියෙ සීමාවෙ මායිම තමයි මේ පාහියංගල පිහිටල තියෙන්නෙ. සමහර අය කියනවා මායිම් ගල කියන එක පාහිංගල උනයි කියල. කළුතර දිස්ත්‍රික්කයත් රත්නපුර දිස්ත්‍රික්කයත් වෙන්වෙන්නෙ මේ මායිමෙන්. පස්දුන් කෝරළයෙ - කුකුළු කෝරළයෙ සීමාවත් මෙතන කියනව නෙව. ඒත් එක්කම ළමයිනේ කියනව නෙව පාහියං කියන දේශ සංචාරක භික්ෂූන් වහන්සේ ශ්‍රී පාදය වඳින්න වඩින කොට මේ පාරෙන් වැඩියයි කියල. දවස් කීපයක් මේ ගල් ගුහාවෙ විවේක සුවයෙන් පසු උනා කියල කියනව. ඒ කතාව චීන රජය බොහොම ඉහළින් පිළිගන්නව නෙව. මේ පහළින් තියෙන ඇළ දිගේ ගිහින් කුරුවිට පැත්තෙන් සිරිපාදෙට යන්න පුළුවන් නෙව.'' ස්වාමීන් වහන්සේ අපට තවත් දිගු විස්තර පෙන්වා දෙති.

# "ළමයි අහල තියෙනව නේද මීමන ප්‍රේමතිලක කවියගෙ "මියුණු ඇල්ල" කියන කවිපෙළ?"

''බලන්න ළමයි මේ මකර තොරණ. මේ ඔක්කොම කරල තියෙන්නෙ නුවර යුගයට අයත් නිර්මාණ ශිල්පයට අනුව. ඒ බව මේ පින්තූර දිහා හොඳින් බැලුවහම වැට-හෙනව. අනිත් එක මේ මූර්ති හදල තියෙන්නෙ කැටගල් එක්ක මැටි මිශ්‍ර කරලා හදපු හුණු බදාමෙකින්. ඒ වගේ ම තීන්ත හදල තියෙන්නෙ මේ කැලෑවෙ ගස්වල මුල්, පොතු, කොළ වගේ දේවල් අඹරල හදා ගත්තු පාටවලින්. අද වෙනකල් ඒ පාට හොඳින් තියෙනව නෙව. දැන් අපි යමු පහළට. දවලුත් වෙලානෙ.'' අපට දවල් වෙන බව වැටහුණේ එවිට ය. ස්වාමීන් වහන්සේ දානයට වැඩම කළ යුතුව ඇත. ඒ

**<u>මෙම පොතෙහි මෙම ක්‍රියාද-ාමය තුළ දී සිදු වූ කෙනෙහිලි, කටුකොහොල්, එදිරිවාදිකම් ගැනද සඳහන් කරමින් මෙම සත්ක්‍රියාව සඳහා ශ්‍රමයෙන්, උපක-රණවලින්, සහ රුපියලකින් හෝ මුදලකින් ආධාර කළ ගමේ සියලු ම දෙනාගේ නම් ඇතුළත් කොට ඇත.</u>**

ගැන සිතෙන අපට ද කුස ගින්න පිළිබඳ සංඥාවක් නොලැබුණා නොවේ. පාහියංගල ගල්ලෙන පිළිබඳව මෙතෙක් දැන නොසිටි බොහෝ කරුණු අපට දැන ගැනීමට අවස්ථාව ලැබීම පිළිබඳව ඇත්තේ මහත් සතුටකි.

' ළමයි අහල තියෙනව නේද මීමන ප්‍රේමතිලක කවියගෙ ''මියුණු ඇල්ල'' කියන කවිපෙළ. නවීන පද්‍ය රචනා කියන පොතේ තියෙන්නෙ. ඒ කියන මියුණු ඇල්ල තියෙන්නේ මීට ටිකක් එහා. පයිනුත් යන්න පුලුවන් කැලේ මැද්දෙන්. ඒ හරියට කියන්නෙ දුම්බර කියල. දුම්බර මිනිරං පතල් හෙමත් තියෙනවනෙ. හොරණින් රත්නපුරා පාරෙන් යනව නම් වාහෙනේකින් උනත් යන්න පුළුවන් ඒව බලන්න.'' අපේ ස්වාමීන් වහන්සේ අපට තවත් බලාපො-රොත්තුවක් දුන්නා සේ ය.

මෙම පළාතට විශාල ආලෝකයක් ලබාදුන් පාහියංගල හන්දියේ සිට නිග්ගහ ගම දක්වා මාර්ගය සකස් කිරීම පිළිබඳව අපූරු වැඩ පිළිවෙළක් ගැන මතක් කිරීමට මෙම අවස්ථාව යොදා ගනිමි. එවකට නිග්ගහ නම් ගම වනාන්තරයෙන් වට වූ ගම්මානයකි. ගමට පිවිසීම සඳහා තිබුණේ අඩි පාරක් පමණ ය. අඩු තරමින් පාගන බයිසිකලයක් වත් නිග්ගහට ගෙන යා නොහැකි තරම් ය. අමාරු රෝගියකු ගෙන යාමට තිබුණු එකම මාර්ගය පුටුවක තබා කදක් සේ බැඳ දෙපසට වන සේ දිගු ලීයක් දමා ඔසවාගෙන යාම ය. ගල්කැටිය හන්දියේ සිට පාහියංගල ට යනතුරු වාහනයක් යා හැකි පරිද්දෙන් පාර සකස් වී තිබුණ ද එතැනින් ඉදිරියට යා යුතු වූයේ පා ගමනින් ම ය. මෙම ගැටලුවට මුහුණ දීම සඳහා ගමේ කීප දෙනෙක් එකතු වී සංවිධානාත්මකව කපන ලද මාර්ගය අද එම පළාතේ ජීවත්වන ජනයාට මහත් ආශිර්වාදයක් වී ඇත. නිග්ගහ ගමේ කරන්දෙනියගේ පොඩිනෝරින් මහතාගේ අදහස ක්‍රියාවට නැගුණේ ඇල්. එච්. හරමානිස් අප්පුහාමි මහතාගේ මූලිකත්වයෙන් යුතු පස-'දෙනෙකුගේ ආරම්භයෙනි. නිග්ගහ ශ්‍රමදාන කණ්ඩායම නමින් සංවිධානය වුණු පිරිස 1961 පොසොන් පෝය දා කාර්යය ආරම්භ කොට ඇත. එවකට අද මෙන් බුල්ඩෝෂර්, ජේ.සී.බී, කැටපිලර්, වැනි උපකරණ නොතිබිණි. සියලු වැඩ කර



ඇත්තේ උදළු, මුල්ලු, අලවංගු, කූඩා සහ වීල්බැරෝ ආදිය යොදා ගනිමිනි.

හරමානිස් මහතාගේ මූලිකත්වයෙන් යුතුව ආරම්භ කරන ලද මෙම සත්ක්‍රියාව පළමුව සිදු කර ඇත්තේ සෑම පෝය දිනක ම ගමේ පිරිස එකතු වී කළ යුතු යයි යන තීරණය මත ය. එම තීරණය පසුව දියුණු වී මසට දෙවරක් වශයෙන් ද, සෑම සතර පෝයට ම ද ආදී වශයෙන් උද්‍යෝගමත් ලෙස ඉලක්කය කරා මාර්ගය කැපීම නොකඩවා කර ඇත. පසු කාලයේ දී දිනපතා ද, රාත්‍රි කාලයේ ද වැඩ කර ඇත. 1961 ජුනි මස 27 වැනි දින ආරම්භ කරන ලද නිග්ගහ පාර 1963 අගෝස්තු මස 31 වන දින විවෘත කරන ලද්දේ අතුරේ බස් කොම්පැනිය හිමි ඇස්. ඩී. එස්. රණසිංහ රාලහාමි සිය මෝටර් රථය පදවාගෙන යාමෙනි. මෙම වසර තුනක කාලය තුළ දී ඇළදොළ, ගස්ගල්, ආදී අසීරු බාධක සහ සමහරුනගේ හරස් කැපීම්, කෙනෙහිලි ආදී සියලු බාධක හමුවේ නොසැලී මුහුණ දී අධිෂ්ඨානපූර්වකව මහත් අභිමානයකින්, උනන්දුවකින් මෙම කාර්යය කර ඇත.




ඇස්. ඩී. ඇස්. රණසිංහ රාලහාමි කීප වාරයක් ම තමා විසින් ම විය පැහැදම් දරා කරන ලද උපකාරවලට අමතරව කැපී පෙනෙන අතිවිශාල ශ්‍රමදාන කඳවුරක තතු මගේ මතකය කියයි. ඒ 1962 අප්‍රියෙල් මස 20, 21, 22 යන තෙදින පාහියංගල විහාරාධිපති වෑවල ධම්මරංසි හිමිපාණන් වහන්සේගේ සහ සර්වෝදය නායක ඒ. ටී. ආරියරත්න මහතාගේ සංවිධානත්වයෙන් කරන ලද මහා ශ්‍රමදානයයි. ලංකාවේ නන් දෙසින් පැමිණි විශාල පිරිසක් මෙම ශ්‍රමදානය සඳහා එක්වුණු ආකාරය ගැන එවකට පුංචි අපට විශේෂයෙන් දැනුණේ එම දින තුන පුරා ම බුලත්සිංහල පරගොඩ පාරේ අපේ ගෙවල් පසු කොට ආ ගිය වාහන කන්දරාව නිසා ය. ඉන් අනතුරුව අප්‍රියෙල් 29 වැනිදා සහ මැයි 13 වනදා යන දෙදින තුළ ද රොනී ද මැල් මහතාගේ මෙහෙයවීම යටතේ බොහෝ පිරිසක් එක්ව කරන ලද සේවය තුළින් ද පාරේ විශාල බරක් හැල්ලු කර ගැනීමට හැකි වූ බව, මෙම පාර කැපීම පිළිබඳව එහි සංවිධායක වන ඇල්. එච්. හරමානිස් මහතා විසින් ලියන ලද 'අඳුරෙන් එළියට' නම් වූ පොතෙහි සඳහන් වේ.

මෙම පොතෙහි මෙම ක්‍රියාදාමය තුළ දී සිදු වූ කෙනෙහිලි, කටුකොහොල්, එදිරිවාදිකම් ගැනද සඳහන් කරමින් මෙම සත්ක්‍රියාව සඳහා ශ්‍රමයෙන්, උපකරණවලින්, සහ රුපියලකින් හෝ මුදලකින් ආධාර කළ ගමේ සියලු ම දෙනාගේ නම් ඇතුළත් කොට ඇත. එහි සඳහන් පුංචි කොටසක් මෙහි පළ කරනුයේ ඇතිවූ එදිරිවාදිකම් සහ පිරිසගේ උද්‍යෝගය පිළිබඳව දැන හඳුනා ගැනීමට මහත් පි-ටුවහලක් වනවා මෙන් ම, එය ලියා ඇති රසවත් භාෂාව ද නිසා පාඨකයනට ඉන් මහත් වින්දනයක් අත් කර ගැනීමට හැකි නිසා ය. උල්පාදොළ නම් වූ ස්ථානයට පාලමක් දැමීම ආරම්භයේ දී අඩි හතළිස් පහක ඇළ කටක් අඩි විසි දෙකක් වන සේ පටු කොට, පැත්තක් අඩි හතලිස් අටක් දිගට හා අඩි දහයක් උසට බඳින ලද යෝධ බැම්ම ඇරඹීමේදී සමහරුන්ගෙන් ඇතිවූ සමච්චල් සහ උසුළුවිසුළු පිළිබඳව ''පල්එක'' නම් මාතෘකාව යටතේ ලියා ඇති එම කොටස මෙසේ ය.

'' බැම්ම ගොඩනගාගෙන එද්දී පෙලක් ඇත්තෝ එය මෝඩ බැම්මක් හැටියටත් තවත් ඇත්තෝ මහා ගොන් වැඩක් හැටියටත් හුවා දක්වමින් මෙහෙමත් මැට්ටෝ යනුවෙන් එහෙමත් කියා, කාරෙක ආ දාට ගඩගඩගා ගල්ටික දොළේ තියෙයි. එදාට පාලම දොළේ පල්ලේ තියෙයි කියා එහෙමත් පලේ පල් කරපු මෙසේ හදා නිමවන තෙක් පලේපල් කර වැඩේ දෙල් වෙනකන් බලා හිටපු, එහෙව් පාලමෙන් හදා නිම කළ දා මැට්ටන්ගේ මෝඩ ගොන් වැඩක් උනත්, උඩ යට අලි ගමන් කරන සැටිත්, කාරෙ-කක් නොව ලෝඩ් එකට පැටවූ ලොරිත්, පුල් එකට කළුගල් පැටවූ ට්‍රැක්ටර්, ඩිපර් පවා ගමන් කර පෙන්වූ මෙසේ ඕනෑම ලෝඩ් එකක් බරක් පැටවූ ඕනෑම වාහනයක් යා හැකි පරිද්දෙන් පාලමට ලොකු ගැම්මක් ලැබෙන සේ බැඳපු යෝධ බැම්ම බැඳීමට මුලදී සතියකට එක් වරක් ශ්‍රමය යොදවා ගෙන ආවේවී නමුත්, වැඩි කලක් ගතවීමට මත්තෙන්, මේ ගැන බලවත් හැඟීමක් කා තුළත් ඇතිවීම හේතුකොට ගෙන තව තවත් ශ්‍රමය යොදන්නට වී, මෙසේ ගමට සුබසෙත ළඟා කරවන දිනය අත ළඟම නොවේදැයි කියා ගමේ ඉමේ දොළේ පාලමට දිනෙන් දින පිරිස වැඩි වන්නටත්, කදිම සේවයක් ලබා දෙන්නටත් හැකි වී තිබුණොත් ඉනික්බිති දිනපතා සේවයක් බවට පත්ව අන්තිමේදී ඒත් සෑහිමකට පත් නොවූ පිරිසට රෑත් සේවය කළ යුත්තේ යයි කියා එහෙමත් යෙ-ාදාගෙන ඉමහත් පිරිසක් දිවා රෑ සේවයක් දිගටම ලබා දෙද්දී'' ආදී වශයෙන් ලියා ඇත.

මගේ මෙම විත්ති පොත ලියාගෙන යන

**20 වන පිටට**